*සැ. යු.* — මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

2012.03.16 දින පළ වූ අංක 1,750 දරන *ගැසට් පත්‍රයේ* I-III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,751 - 2012 මාර්තු මස 23 වැනි සිකුරාදා - 2012.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 718 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 30 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් සභා නිවේදන

**බලය පැවරීමේ නියෝගය**

උතුරු මැද පළාත් සභාවේ 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, පේෂ කර්මාන්ත, ග්‍රාම සංවර්ධන හා නිවාස පිළිබඳ ඇමති හේරත් බංඩා සේමසිංහ වන මම උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ බලතල වලින් උතුරු මැද පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහාය වීමට සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත්කර ඇත්තා වූ පහත සඳහන් උපලේඛනයෙහි I වැනි තීරුවෙහි සඳහන් අය වෙත එම උපලේඛනයේ III වැනි තීරුවෙහි සඳහන් සියලු බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

හේරත් බංඩා සේමසිංහ,
සමුපකාර, වෙළඳ හා ආහාර, පේෂ කර්මාන්ත,
ග්‍රාම සංවර්ධන, කර්මාන්ත සහ නිවාස අමාත්‍ය,
උතුරු මැද පළාත.

2012 පෙබරවාරි මස 29 වැනි දින.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| 01. සුහසිංහ දේශප්‍රියගේ ජයසිරි හත්නාගොඩ | 2011.04.27 | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 33, 44, 45, 52, 53, 54, 55, 56, 57, 58, (3), 58 (4) සහ 58 (5) හැර) 59 (59(1) (ආ) හැර), 60(1), 60(2), 68 වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16 (ii), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 (49 xii) හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ සියලුම බලතල. |

03-803

---

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ නියෝගය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය අතුල සරත් කුමාර විජේසිංහ වන මම වයඹ පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහාය වීමට පත් කර ඇත්තා වූ මීට අමුණා ඇති උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත් වලින් සංශෝධිත වූ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III තීරුවෙහි සඳහන් සියලුම බලතල එකී උපලේඛනයේ II වන තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

අතුල සරත් කුමාර විජේසිංහ,
වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන,
මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, ඉඩම්,
ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන
සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන සහ
ආහාර සැපයුම් හා බෙදාහැරීමේ අමාත්‍ය.

2012 පෙබරවාරි මස 27 වැනි දින,
කුරුණෑගල දී ය.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| පෙතියාගොඩ ජෝන් රණසිංහ ආරච්චිගේ විශ්වප්‍රිය චින්තක රණසිංහ | 2012.01.19 | සමුපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44, [44(6) හැර] 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58(5) හැර] 59, 68, සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4, 11, 15, 16, (ii) 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49[49(xii) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාගේ සියලුම බලතල. |

03-921

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.